# පුරප්පාඩු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)**

## අධ්‍යක්ෂ ජනරාල්/
## ප්‍රධාන විධායක නිලධාරී තනතුර

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 02/2016 වැටුප් ගෙවනු ලැබේ.

**සුදුසුකම්**

(අ) විද්‍යාව / කෘෂිකර්මය / නීති / ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**සමග**

සමාජ විද්‍යාව / ජනමාධ්‍ය / නීතිය / ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

**හෝ**

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 35 නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය** : HM 1-1 රුපියල් 80,295 - 15 X 2,270 - 114,345

අයදුම්කරුවන්, තමන් පිළිබඳ තොරතුරු විමසිය හැකි වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සිය අධ්‍යාපන හා වෘත්තීය අත්දැකීම් පිළිබඳ විස්තර ප්‍රකාශයක් (CV)2025.02.10 දින හෝ එයට ප්‍රථම පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුය.

**සභාපති,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද කොමිෂන් සභාව,**
**කාමර අංක 203-204,**
**ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,**
**කොළඹ 07, හෝ**

**විද්‍යුත් තැපෑල** info@rtic.gov.lk

තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.